NALANDA V **නාලන්දා විද්‍යාලය - කොළඹ 10** DA VIDYALAYA

NALANDA VIDYALAYA **ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය** NALANDA VIDYALAYA

| 9 ශ්‍රේණිය | ගණිතය | ඒකකය:14 පථ හා නිර්මාණ |
|---|---|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. $P$ ලක්ෂ්‍යයට $5cm$ ක් දුරින් ගමන් කරන ලක්ෂ්‍යයක පථය නිර්මාණය කරන්න.

කණුවක ගැට ගසා ඇති ගවයාගේ ලණුවේ දිග $6m$ ක් වේ. ගවයාට තණකොළ කෑ හැකි පෙදෙස දැක්වීමට $2m$ ට $1cm$ ක පරිමාණයෙන් නිරූපණය කර අඳුරු කර දක්වන්න.

02. පූසෝ දෙදෙනෙක් $8m$ ක් එකිනෙකාට ඇතින් සිටිති. පූසන් දෙදෙනාට සම දුරින් මීයෙක් ගමන් කරයි. $1m$ ක් $1cm$ කින් නිරූපණය කර මීයාගේ ගමන් මග සලකුණු කරන්න.

03. මහේල, උපුල් හා ඩිල්ෂාන් එකිනෙකාට ඇතින් සරල රේඛීයව නොවන සේ පන්දු රකිමින් සිටිති. සචින් එල්ල කළ උඩ පන්දුව තිදෙනාටම සම දුරින් වූ ලක්ෂ්‍යයක පතිත විය. පථ දැනුම භාවිතයෙන් පන්දුව පතිත වූ තැන සලකුණු කර දක්වන්න.

04. සනත් හා මහේල එකිනෙකාට $20m$ ක් ඇතින් පන්දු රකිමින් සිටිති. නවසීලන්ත ක්‍රීඩකයකු එල්ල කළ පහරක් දෙදෙනාටම සම දුරින් ගමන් කර හතරේ සීමාව පසු කළේය. පන්දුවේ ගමන් මග දළ සටහනක දක්වන්න.

05. අධිවේගී මාර්ගයක එක්පසකින් $30m$ ක් ඇතින් දුම්රිය මාර්ගයක් තනයි. දුම්රිය මාර්ගය දැක්වීමට දළ සටහනක් අඳින්න.

06. ඉඩමක නිවසට $6m$ ක් ඇතින් තාප්පයක් තැනීමට අදහස් කරයි. එක් පැත්තක බිත්තියක් නිරූපණය කර තාප්පය තැනෙන ආකාරය දළ සටහනක දක්වන්න.

07. $A\hat{B}C$ $70^0$ වූ කෝණයක් කෝණමානය භාවිතයෙන් නිර්මාණය කර එය සමච්ඡේදනය කරන්න.

08. $P\hat{Q}R$ $120^0$ ක් වූ කෝණය කෝණමානය භාවිතයෙන් නිර්මාණය කර එය සමච්ඡේද කර දක්වන්න.

09. $8cm$ ක් දිග $AB$ සරල රේඛාව අඳින්න. එහි ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

10. ලම්බ සමච්ඡේදකය නිර්මාණය කිරීම පිළිබඳ දැනුම භාවිතයෙන් $8.5cm$ ක් දිග සරල රේඛාවක් සමාන කොටස් 4 කට බෙදන්න.

11. පහත දැක්වෙන කෝණ නිර්මාණය කරන්න. (කවකටුව පමණක් භාවිතයෙන්)

(1) $15^0$ (2) $30^0$ (3) $22.5^0$ (4) $45^0$

(5) $60^0$ (6) $75^0$ (7) $90^0$ (8) $105^0$

(9) $120^0$ (10) $135^0$

EXAMRESULTS.LK

12. $AB=6cm, B\hat{A}C=60^0$ හා $AC=5cm$ ක් වූ $ABC$ ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

13 $PQ=7cm, Q\hat{P}R=45^0$ හා $P\hat{Q}R=60^0$ වූ $PQR$ ත්‍රිකෝණය නිර්මාණය කරන්න. $PQ$ හි ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

14.
(1) $XY=7cm, Z\hat{X}Y=90^0, X\hat{Y}Z=45^0$ වූ $XYZ$ ත්‍රිකෝණය නිර්මාණය කරන්න.
(2) $XY$ පාදයේ ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න.
(3) $XZ$ පාදයේ ලම්බ සමච්ඡේදකය ද නිර්මාණය කරන්න.
(4) සමච්ඡේදක ඡේදන ලක්ෂ්‍යය $O$ ලෙස නම කරන්න.
(5) $O$ කේන්ද්‍රය ද, $X$ ලක්ෂ්‍යය අරය ද ලෙස ගෙන වෘත්තයක් නිර්මාණය කරන්න.

**වසන්ත වඩුගේ (BSc. PGDE)**